ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විවිධ අවශ්‍යතා සඳහා ආහාරපාන සැපයුම් ආයතන ලියාපදිංචි කරගැනීම සඳහා අයදුම් පත්‍ර කැඳවීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අවශ්‍යතා සඳහා වසර තුනක (2026/2029) කාලයකට ආහාරපාන සැපයීමට සුදුසු සැපයුම් ආයතන ලියාපදිංචි කර ගැනීම සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

මෙම කාර්යයට අදාල විස්තර සහ අයදුම්පත්‍රය ජා.ග.කොා.සභාවේ නිල වෙබ් අඩවිය වන www.ntc.gov.lk මඟින් බාගත කිරීම කළ හැක. නැතහොත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් නොමිලේ ලබාගත හැක. අවශ්‍ය විස්තර 0112503969 දුරකථන අංකයෙන් ලබා ගත හැක.

මේ සඳහා උනන්දුවක් දක්වන ආහාරපාන සැපයුම්කරුවන් සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026/11/03 දින පෙ.ව 11:00** ට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිම හෝ ජා.ග.කොා.සභාවේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිම කල යුතුය.

අදාල ලංසු එම දින දක්වා ඇති වේලාව අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ.

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ **විවිධ අවශ්‍යතා සඳහා ආහාරපාන සැපයීම** (වසර තුනක කාලයක්) අයදුම්පත්‍රය

1. ආයතනයේ නම : .....

2. ලිපිනය : .....

3. දුරකථන අංක : ....

4. ලියාපදිංචි විස්තර (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හා ආහාර සැපයුම් කිරීමට අදාලව ලියාපදිංචිකර ඇති සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

5. ආහාරපාන සැපයීම සම්බන්ධව පළපුරුද්දක් ඇත්නම් අදාල විස්තර : .....

   .....
   (අදාල ලේඛණ පිටපත් ඇමිණිය යුතුය.)

6. ඔබ ඉදිරිපත් කර ඇති මිල ගණන් සඳහා බදු ඇතුලත් කල යුතු නම් පහත විස්තර ලබාදෙන්න.
   බදු ලිපි ගොනු අංකය : ..... (VAT ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

7. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විවිධ අවශ්‍යතා සඳහා ආහාරපාන සැපයීම සඳහා ලියාපදිංචි කරගැනීමට අදාල විස්තර පත්‍රිකාවේ අංක 01 සිට 11 දක්වා කරුණු වලට එකඟ වන බවත්, ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවටත් මෙම ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන ආයතනය / ආයතන හිමිකරු / හිමිකරුවන් වන මා අප ආයතනය ආහාරපාන සැපයීම සම්බන්ධව හෝ වෙනත් කාරුණකට අදාලව වරදක් / සපරාධී ක්‍රියාවකට වරදකරුවී බන්ධනාගාර ගතවී හෝ ලියාපදිංචිය අවලංගු කර නොමැති බවත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව සඳහා ආහාරපාන සැපයීමට ආයතනය / සුදුසු වුවහොත් වසර තුනක කාලයක් විස්තර පත්‍රිකාවේ සඳහන් පරිදි කටයුතු ඉටුකිරීමට එකඟතාව ප්‍රකාශ කරමි.

....
නම අත්සන/ අත්සන

.....
දිනය

.....
ආයතනයේ නිල මුද්‍රාව

2026/2029 (2026 නොවැම්බර් සිට 2029 නොවැම්බර් දක්වා වසර තුනක කාලසීමාවක් සඳහා) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විවිධ අවශ්‍යතා සඳහා ආහාරපාන සැපයුම් ආයතන ලියාපදිංචි කරගැනීමට අදාල විස්තර පත්‍රිකාව

1. පසුගිය කාල සීමාවේ වසරක කාලය තුළ දළ වශයෙන් රුපියල් මිලියන 3.5 පමණ ආහාරපාන ලබාගැනීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කර ඇත.

2. කොළඹ නගර සභාවේ සෞඛ්‍ය අංශයේ A / B ශ්‍රේණියේ හෝ පිළිගත් රාජ්‍ය ආයතනයක ආහාර සැපයීම සඳහා ලියාපදිංචි වී සිටිය යුතු අතර අයදුම් කරන විට ලියාපදිංචිය වලංගුව පැවතිය යුතු වේ. එසේම අයදුම්පත්‍රය සමඟ අදාල සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු වේ. තවද ලියාපදිංචි කාලය තුලදී සහතිකය වලංගුව පැවතිය යුතු බැවින් අලුත් කිරීම් සිදු කර අදාල පිටපත ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාර දිය යුතුය.

3. අංක : 241, උද්‍යානපාර,කොළඹ - 05. පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා නොමිලේ ආහාරපාන ප්‍රවාහනය කර සපයා දීම තෝරා ගනු ලබන ආයතනය මඟින් සිදුකළ යුතු වේ.

4. ලියාපදිංචිය සඳහා තෝරා ගන්නා සැපයුම්කරුවන් වසර තුනක කාලයක් සඳහා ආහාරපාන සැපයීමට අදාලව ගිවිසුමකට එළඹිය යුතු වේ.

5. තෝරා ගන්නා සැපයුම්කරුවන් වෙත සති 02 ක කාලයකට වරක් සපයා ඇති ආහාරපාන ප්‍රමාණය අනුව අදාල ගෙවීම් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් සිදුකරනු ලැබේ.

6. දැන්වීමේ සඳහන් පරිදි අදාල අයදුම්පත නියමිත දින දක්වා ඇති වේලාවට ප්‍රථම යොමු කළ යුතු අතර අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ **ආහාරපාන සැපයුම් ආයතන ලියාපදිංචි කිරීම** ලෙස සඳහන් කළ යුතුය.

7. ලියාපදිංචි කරගනු ලබන ආයතන විසින් සපයා ඇති ආහාරපාන මත හෝ ප්‍රවාහනයේදී ඇතිවන ගැටළුකාරී තත්ත්වයන් (ආහාර වල ගුණාත්මකභාවය / පිරිසිදුභාවය / නියමිත වේලාවට සැපයීමට නොහැකිවීම / වෙනත්) පිළිබඳ තීරණ ගැනීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන කමිටුවක් වෙත යොමුකරන ලබන අතර මෙම කමිටුව විසින් ගනු ලබන තීරණ ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

8. ආයතනයේ අවශ්‍යතා සඳහා දිවා අහාරය අවශ්‍ය වන විටදී අවශ්‍ය ආහාර වර්ගය (මස් /මාළු/ බිත්තර) සහ අවශ්‍ය ප්‍රමානය අදාල දින පෙ.ව 09:30 ට පෙර දැනුම්දීමේදී එම ආහාර ප්‍රමානය සැපයීමට හැකියාව තිබිය යුතුය.

9. ඇමුණුමේ සඳහන් කර ඇති මිල ගණන් වෙනස් කිරීමේදී අවශ්‍ය විටදී ඒ සඳහා නිශ්චිත හේතු සඳහන් කරමින් ලිඛිත ඉල්ලීමක් ආහාරපාන සැපයුම් ආයතන මඟින් අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත සහකාර අධ්‍යක්ෂ ප්‍රසම්පාදන වෙත පිටපතක් සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කල යුතුවේ.

10. ආහාරපානභී මිල ගණන් ජාතික මට්ටමින් අඩුවීමේදී එම තත්ත්වයන් සලකා සැපයුම් ආයතන විසින් තම ඉදිරිපත් කර ඇති මිල ගණන් ද අඩුවීමේ මිලට සාපේක්ෂව ගැලපිය යුතුවේ. එසේ කිරීමට අපොහොසත් වීමේදී ලිඛිතව දන්වා අදාල ලියාපදිංචි අවලංගු කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කරනු ලැබේ.

11. මෙම කාර්යයට අදාල සියලු විස්තර 0112503969 දුරකථන අංකය ඔස්සේ ජාතික ගමනාගමන සභාවේ ප්‍රසම්පාදන අංශය මගින් ලබා ගත හැක.